Dulay—P

# කලාප අධ්‍යාපන කාර්යාලය - මතුගම
# வலயக் கல்விக் காரியாலயம் - மத்துகம
# ZONAL EDUCATION OFFICE - MATUGAMA


කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ / வலயக் கல்விப் பணிப்பாளர் / Zonal Director of Education — 0342248107

දුරකථන - පොදු / தொலைபேசி - பொது / General Telephone — 0342247218

"ගුණාත්මක අධ්‍යාපනයක් - ගුණාත්මක ශිෂ්‍යයෙක්"
" A Quality Student through Quality Education "
" தரமான கல்வியினூடாக – தரமான பிள்ளை "

ෆැක්ස් / தொலைநகல் / Fax — 0342248107

ඊ-මේල් / மின்னஞ்சல் / E-mail — mat@edudept.wp.gov.lk


මගේ අංකය / எனது இல. / My No. — බප/මතු/කලාප/ මූ.ශා.16/25/16

ඔබේ අංකය / உமது இல. / Your No. —

දිනය / திகதி / Date — 2025. 11 04

EWIS PERIPHERALS (PVT) LTD.
RECEIVED
04 13 NOV 2025

01. මෙට්‍රෝපොලිටන් ටෙක්නොලජීස් පුද්. සමාගම. නො.12, මැගසින් පාර, කොළඹ 08.
02. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පි.එල්.සී. නො. 248, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
03. V.Y.S. ඉන්ටර්නැෂනල් පුද්. සමාගම. 199/6, හොරණ පාර, කොට්ටාව.
04. ජෝන් කීල්ස් ඔටෝ මේෂන් (පුද්) සමාගම. -නො.90 ,යුනියන් ප්ලේස් ,කොළඹ 02
05. ඔනිම්ට්‍රා හයිටෙක් සොලූෂන් පුද්. සමාගම නො.278, මොරගහයට, රත්නපුර.
06. සිලොන් බිස්නස් ඇප්ලයන්ස්. නො. 193, හිල් ස්ට්‍රීට්,දෙහිවල.
07. සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව.100, නවම් මාවත, කොළඹ 02.
08. ඊවිස් පෙරිපෙරල්ස් (පුද්) සමාගම.-යත්මා බිල්ඩින්, 142, ගාළුපාර ,කොළඹ 03.

<u>මතුගම කලාප අධ්‍යාපන කාර්යාලය සඳහා ඡායාපිටපත් යන්ත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>

මතුගම කලාප අධ්‍යාපන කාර්යාලයට ඡායා පිටපත් යන්ත්‍ර 05ක් මිලදී ගැනීම සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ මිල ගණන් ඉදිරිපත් කල ආයතන වලින් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ නැවත ලංසු කැඳවනු ලැබේ.

02. ඔබගේ ලංසු ඉදිරිපත් කිරීමේදී , ඇමුණුම 01 ආකෘතියෙහි සඳහන් මිල ගණන් පත්‍රය සම්පූර්ණ කර ලංසුව සමඟ ඉදිරිපත් කළයුතුය. එම මිල ගණන් 2025.11.17 දින සිට 2025.12.31 දින දක්වා වලංගු විය යුතුය.

03. ඉහත ඇමුණුම 01 සඳහන් ආකෘතිය පරිදි සකස් කර ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් කොන්දේසි විරහිත විය යුතු අතර, එය **2025.11.17** දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පැරණි ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ නිල කාමරයේ තබාඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිම කළ යුතුය. නියමිත දින නියමිත වේලාවෙන් පසුව ලැබෙන මිල ගණන් විවෘත නොකොටම ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් බහා එවන ලිපි කවරයේ ඉහල වම් කෙලවරේ " ඡායා පිටපත් යන්ත්‍ර මිලදී ගැනීම - 2025 " යන්න සඳහන් කල යුතුය. මිල ගණන් 2025.11.17 දින පෙ.ව. 10.00 ට මතුගම කලාප අධ්‍යාපන කාර්යාලයේදී විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

04. ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කරඇති භාණ්ඩවලට අදාල ආදර්ශ භාණ්ඩ දැනුම් දුන්විට ඉදිරිපත් කළයුතු අතර, ඇණවුම් කරන ලද භාණ්ඩ සෑම අතින්ම ආදර්ශ භාණ්ඩවලට සමාන විය යුතුය. එසේ නොවන භාණ්ඩ ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒ සඳහා කිසිදු ගෙවීමක් කරනු නොලැබේ. තවද, මිලදී ගන්නා ප්‍රමාණයන් අඩු හෝ වැඩි කිරීමේ බලය කලාප කාර්යාලීය ප්‍රසම්පාදන කමිටුව සතු වන්නේය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව,
කලාප අධ්‍යාපන කාර්යාලය .
මතුගම.

**ජී. ශ්‍රී. වික්‍රමආරච්චි**
**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (සං. ආ.)**
**කලාප අධ්‍යාපන කාර්යාලය**
**මතුගම,**

01. ගොනුව